# ආපදා වාර්තාකරණය හා ලාංකීය පුවත්පත් ක්‍රියාකාරීත්වය

## 2004 සුනාමි ව්‍යසනයේදී (ලාංකීය පුවත්පත් හැසිරීම) තෝරාගත් පුවත්පත් කිහිපයක් ඇසුරින් කෙරෙන පර්යේෂණාත්මක අධ්‍යයනයකි.


පී.එන්.පී. පෙරේරා

FGS/MACO/MC/08/011


සමාජීය විද්‍යාපති උපාධිය (MSSC)


| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1221 |
| වර්ග අංකය: | |



සමාජීය විද්‍යාපති - ජනසන්නිවේදනය

කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව


2015 මාර්තු

# සංක්ෂේපය

නූතනයේ ජනසන්නිවේදනය තදාත්මීය සංකල්පයක් බවට පත් වීමට මූලික ම හේතුව වන්නේ අතීතයට සාපේක්ෂ ව ඉතා දියුණු ජනමාධ්‍ය ව්‍යූහයක් ගොඩනැගී තිබීමයි. පුද්ගලයා හා සමාජය පාලනය කරන ප්‍රබල ම යාන්ත්‍රණය බවට ජනමාධ්‍ය පත් ව තිබෙන්නේ ද එම නිසායි. විද්‍යුත් හා මුද්‍රිත හෝ නව මාධ්‍ය සන්නිවේදනයේදී මහජන තොරතුරු සම්ප්‍රේෂණයට ලැබී තිබෙන්නේ පෙරටත් වඩා වැඩි ප්‍රමුඛතාවකි. එහිදී සවිඤාණික ග්‍රාහකයා හුදු විනෝදාස්වාදය මත යැපීම පමණක් ජනසන්නිවේදන මාධ්‍යයෙන් අපේක්ෂා නොකරන අතර, අවබෝධය, දැනුවත්වීම හා තීරණ ගැනීම සඳහා ද ජනමාධ්‍ය මෙවලමක් කර ගනී.

ජනමාධ්‍ය මඟින් මහජන තොරතුරු සම්ප්‍රේෂණයේදී වාර්තාකරණයේ ස්වරූපය ග්‍රාහක චර්යාව කෙරෙහි ප්‍රබල සාධකයක් වන බව මාධ්‍ය මනෝ විද්‍යානුකූල ව ද පිළිගන්නා කරුණකි. ප්‍රධාන වශයෙන් සාමාන්‍ය ප්‍රවෘත්ති වාර්තාකරණය හා ගවේෂණාත්මක තොරතුරු වාර්තාකරණය යනුවෙන් දෙ වැදෑරුම් ව මාධ්‍ය වාර්තාකරණය හඳුනාගනී.

මිනිස් ක්‍රියාකාරකම් නිසා හෝ ස්වභාවික සංසිද්ධි හේතුවෙන් හෝ ආපදා තත්ත්ව නිර්මාණය වෙයි. එවැනි ව්‍යාකූල සමාජ පසුබිමක ජනසන්නිවේදන මාධ්‍ය මඟින් සිදුවන ආපදා සන්නිවේදනය නැතහොත් ආපදා වාර්තාකරණය අපට සරලව අර්ථ නිරූපණය කළ නොහැකි ය. එය ඉතා සංකීර්ණ සේ ම සංවිධිත ව සිදු විය යුත්තකි. ඊට හේතුව සමාජය නියාමනය කරන ප්‍රමුඛ සාධකයක් වශයෙන් ජනමාධ්‍යට සිවිල් සමාජ බලයක් ආරෝපණය වන බැවිනි.

ආපදා මොහොතේ පමණක් නොව පූර්ව හා පශ්චාත් ආපදා තත්ත්වයන් පිළිබඳ ව ද සමාජය දැනුවත් කිරීම යහපත් මාධ්‍ය වාර්තාකරණයකින් අපේක්ෂා කරයි. එම වාර්තාකරණය හුදු ගෙන හැර පෑමක් නොවිය යුතු අතර ම ගැඹුරු විශ්ලේෂණයක් මත සමාජය දැනුවත් කරන තථ්‍ය හා නිවැරදි මෙන් ම මාධ්‍ය ආචාරධර්ම ගරු කරන්නක් ද විය යුතු ය.

මෙම පර්යේෂණයේදී 2004 සිදුවූ සුනාමි ව්‍යසනය ආශ්‍රිත ව මෙරට මුද්‍රිත මාධ්‍ය (පුවත්පත්) වාර්තාකරණය පිළිබඳ ව විමසනු ලබයි. එහිදී පෙර කී කාරණා මත පදනම් ව සත්‍ය හා නිවැරදි මාධ්‍ය ආචාරධර්ම ඔස්සේ වාර්තාකරණය සිදු වී ද යන්න විමර්ශනය කිරීමට අපේක්ෂා කෙරේ.

එසේ වී නම් එය වඩාත් සාධනීය කර ගත හැකි සහ එසේ නොවී නම් යහපත් ආපදා සන්නිවේදන හා වාර්තාකරණ ක්‍රියාවලියක් ස්ථාපිත කර ගත හැකි නිර්දේශ යෝජනා හා උපමාන හඳුන්වාදීම ද මෙහි අරමුණකි.

ඉඟිපද - **"ආපදා"**,**"ස්වභාවික ආපදා"**,**"ආපදා සන්නිවේදනය"**,**"ආපදා වාර්තාකරණය"**,

**"මාධ්‍ය ආචාරධර්ම"**

## Abstract

The reason that modern mass communication has become an identical concept is the occurrence of the advanced media structure. That is why the media has become the prominent mechanism of controlling the individual as well as the society. There is an unprecedented priority in transmitting public information in electronic and print or new media communication. In that case, conscious subscriber does not expect just the recreation from communication media but use it as a tool for improving understanding, awareness and decision making.

It is an acceptable fact even in psychology that nature of reporting in transmission of information is a powerful factor that influences on the subscribers behavior. Mainly, the media reporting can be identified in two aspects as general news reporting and exploratory news reporting.

Disasters are caused by human activities or natural phenomena. The disaster communication or the disaster reporting in such a complicated social background could not be simply interpreted. It should be complex as well as formal, as the media has a civil power as a key factor that regulates the society.

Making aware the society in the disaster situation as well as in pre and post disaster situations is expected from good media reporting. It should not be just an abstraction of information but should be based on deep analysis and should be true and accurate and conforms to media ethics.

This research studies print media reporting (newspapers) related to tsunami disaster occurred 2004. It is expected to study whether the related reporting is true and correct and whether they are conformed to media ethics.

If so, introducing a way to improve its quality or, otherwise make recommendations, proposals, and criteria for establishing a well-mannered disaster reporting process is another objective of this research.

Keywords – '**Disaster**', '**Natural disaster**', '**Disaster communication,**

'**Disaster reporting**', '**Media ethics**'